**කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූලි 24 දිනද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන් තිදෙනෙක් වෙත ගෙවිය යුතු රු.481,642ක් ණයහිමි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුල රු.663,729ක් වැයකර මහගම මහජන පුස්තකාලයේ සිදුකර තිබුණු අළුතින් ඉදිකිරීම් හා සවිකිරීම් ගිණුම්ගත කොට නොතිබුණි. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉපලෝගම ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයින් 31 දෙනෙකුගෙන් අයවිය යුතු රු.158,000ක හිඟ සාමාජික ගාස්තු හා සභාවේ බදු දුන් කඩකාමර වෙනුවෙන් බදුකරුවන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු රු.71,490ක විදුලි ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් වර්ෂවලට අදාළ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ / ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතු ගිණුම් ශේෂ 07ක එකතුව රු.10,098,945ක් වූ අතර ඒ අතරින් වසර 03 ඉක්මවූ ලැබිය යුතු ශේෂය රු.762,054ක් විය. | සභාවට ලැබිය යුතු හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ වරිපනම් බදු, ජල බදු, විවිධ ණයගැතියෝ සහ කර්මාන්ත ණයගැතියෝ කොටසක් අයකර ඇති අතර ඉතිරි හිඟ මුදල් සහ හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 06ක එකතුව රු.9,770,505ක් වූ අතර ඒ අතරින් වසර 03 ඉක්මවූ ගෙවිය යුතු වටිනාකම රු.1,333,996ක් විය. | ගෙවිය යුතු ගිණුම් ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | විවිධ ණයහිමි, කර්මාන්ත ණයහිමි, විවිධ තැන්පතු කොටසක් නිරවුල් කර ඇති අතර ඉතිරි ශේෂ සහ ආදායම් වෙනුවෙන් තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු වටිනාකම රු.5,897,151ක් වූ ගිණුම් විෂයයන් 03කට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | කාර්යාලීය රැස්වීම් ශාලාව සහ අත ඉතිරි ජල නල උපාංග සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි ඉදිරියේදී ඉදිරිපත් කරන අතර, නල ළිං ගාස්තු සම්බන්ධ තොරතුරු සභාව සතුව නොමැති බව දන්වා සිටිමි. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 129(2) (ඊ) වගන්තිය | ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු රු. 751,756 ක් වූ කුලී විධිමත් පරිදි අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | තවදුරටත් අයවිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ හිටි කඩකාමර කුලී අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 වගන්තිය | වසර 02ක් ඉක්මවූ රු.117,000ක් වූ තැන්පතු 14ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වසර 02ක් ඉක්මවූ තැන්පත් ශේෂ ඉදිරියේදී නිදහස් කිරීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.1,112,273ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.2,024,927ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 9,055 | 5,156 | 4,396 | 2,153 | 5,715 | 4,400 | 4,895 | 1,523 |
| කුලී | 2,687 | 1,828 | 1,600 | 752 | 2,601 | 2,346 | 2,019 | 577 |
| බලපත්‍ර ගාස්තු | 177 | - | 141 | - | 242 | - | 84 | - |
| වෙනත් ආදායම් | 39,274 | - | 34,067 | - | 36,238 | - | 27,260 | - |
| | 51,193 | 6,984 | 40,204 | 2,905 | 44,796 | 6,746 | 34,258 | 2,100 |

රැස්කළ ආදායම තුල වර්ෂයේ බිල්කළ ආදායමෙන් රැස්කළ ආදායම සහ හිඟහිටි ආදායමෙන් රැස්කළ ආදායම් ඇතුලත්ව තිබේ.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මුළු බිල්කළ ආදායම රු.6,983,491ක් හා සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති හිඟ ආදායම රු.2,099,948ක් වූ අතර, සමාලෝචිත වර්ෂය තුලදී බිල්කළ ආදායමෙන් රු.5,538,228ක් හා හිඟ ආදායමෙන් රු.1,109,264ක් රැස්කර තිබුණි. ඒ අනුව වර්ෂය තුල සමස්ත ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 73ක් පමණ විය. | වාර්ෂිකව බිල්කළ ආදායම් වර්ෂය තුලදීම අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් ඉදිරියේ අය කිරීමට කටයුතු කරමි. |

**2.2.3** ජල බදු

--------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කරුවලගස්වැව සහ ඉපලෝගම ජල ව්‍යාපෘතිවල ජල සැපයුම විසන්ධි කරන ලද ජල පාරිභෝගිකයින් 63කගේ හිඟ ජල ගාස්තු රු.132,649ක් සහ ඉපලෝගම ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයින් 31 දෙනෙකුගේ හිඟ සාමාජික ගාස්තු රු.158,000ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ගාස්තු අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**2.2.4** කුලී

-------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල්කළ කඩ කුලී රු.1,185,177න් වර්ෂය තුලදී රු.927,032ක් අයකර තිබුණු අතර එය බිල්කළ මුදලින් සියයට 78ක් විය. සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟ හිටි කඩ කුලී රු.520,757න් වර්ෂය තුලදී රු.124,362ක් අයකර තිබුණු අතර එය වර්ෂය ආරම්භයේ හිඟ හිටි මුදලින් සියයට 24ක් විය. | වර්ෂය තුල බිල්කළ කඩ කුලී වර්ෂය තුලදීම අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**2.2.5** උසාවි දඩ

------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.2,725,644ක් විය. | සමාලෝචිත වර්ෂයට අදාළ සියළු දඩ මුදල් හඳුනාගෙන අය කරගත යුතු වේ. | 2019 වර්ෂයට අදාළව ලැබිය යුතු උසාවි දඩ මුදල් සියල්ල රු.2,725,644ක් 2020 වර්ෂයේ ලැබී ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණු නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 03ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අදාළ අතුරු ව්‍යවස්ථා පනවා මහජන සුභසාධනය වෙනුවෙන් සේවා සැපයීමට කටයුතු කළ යුතු වේ. | පොදු විනෝදය සඳහා ස්ථාන සැපයීම, පාලනය කිරීම සහ ඒවායේ කළමනාකරණය සඳහා වූ නව අතුරු ව්‍යවස්ථාවන් සම්පාදනය කර එහි සංශෝධන කටයුතු සිදු කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යොමුකර ඇති අතර අනෙකුත් කාරණා වෙනුවෙන් ඉදිරි කාලයේදී පනවා ගැනීමට කටයුතු කරමි. |

**(ආ) ඉටු නොකල කාර්යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික අයවැය මගින් රු.63,418,000ක ප්‍රතිපාදන සලසා තිබුණු කර්තව්‍යයන් 26ක් වර්ෂය තුල ඉටුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ රු.62,350,000ක් වූ මූලධන වියදම් ඇස්තමේන්තු මුදලින් වර්ෂය තුල වැයකර තිබුණේ රු.299,059ක් වැනි ඉතා අඩු ප්‍රතිපාදන ප්‍රමාණයකි. එය ඇස්තමේන්තු වටිනාකමින් සියයට 0.48ක ප්‍රමාණයක් වේ. | වාර්ෂික අයවැය මගින් යෝජිත කර්තව්‍යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ අඩු ආදායම් තත්ත්වය හා පළාත් නිශ්චිත ආධාර ඇතුළු අනෙකුත් අමාත්‍යාංශ ආධාර අපේක්ෂිත පරිදි නොලැබීම හේතුවෙන් අයවැය මගින් යෝජිත ව්‍යාපෘති සියල්ලම ඉටු කිරීමට නොහැකි විය. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේ රු.1,338,227ක් හා 2018 වර්ෂයේ රු.719,200ක් වැයකර කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණද නගරයේ කසළ එක්රැස් කර බැහැර | විධිමත් ආකාරයෙන් කසළ ප්‍රතිචක්‍රීකරණය හා බැහැර කිරීම සිදු කළ යුතු වේ. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති යටතේ කසළ එක්රැස් කිරීම සිදු කරනු ලබන අතර ඒවා නොදිරන හා දිරන ලෙස වෙන් කර නොදිරන කසළ අලෙවි කිරීම සිදු |

| | | |
|---|---|---|
| කිරීම හැර අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලියක් ආරම්භ කර නොතිබුණි. | | කරනු ලබයි. දිරන කසළ විශාල ප්‍රමාණයක් නොමැති හෙයින් වල ක්‍රමය යටතේ කොම්පෝස්ට් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 20ක් වර්ෂය තුළ ආරම්භ කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉතා අඩු ආදායම්ලාභී සභාවක් බැවින් අදාළ කාර්යයන් ඉටු කිරීමට නොහැකි විය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පසුගාමී හා හුදකලා ගම්මාන ව්‍යාපෘතිය 2017 යටතේ පෞද්ගලික ඉඩමක සිදුකර තිබුණු ඔල්ලුක්කුලිය ළිඳ ඉදිකිරීම, ළිඳ වටා වැටක් ඉදිකිරීම හා පිවිසුම් මාර්ගය සකස් කිරීම සඳහා රු.1,089,055ක් වැයකර තිබුණු අතර මෙම ඉදිකිරීම් සහිත භූමිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | අදාළ භූමිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිකරන ලද ළිඳ පිහිටි ඉඩමේ හිමිකරු පැවරීම සඳහා කැමැත්ත ලිඛිතව දන්වා ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මෙම ඉඩම මැනීම සඳහා අවශ්‍ය මිනුම් නියෝගයක් ලබාදෙන ලෙස 2017.11.02 ඉල්ලීම් කර ඇත. ඉතා කඩිනමින් මෙම කටයුත්ත සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවට දැනුම් දෙමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව විසින් කුලියට දී තිබුණු කඩ කාමර 16ක් වසා දමා තිබුණු අතර එම වසා දමා තිබුණු කඩ කාමර හා තව දුරටත් පවත්වාගෙන යන කඩ කාමර 16කින් අයවිය යුතු හිඟ කුලී මුදල් සහ හිඟ විදුලි ගාස්තු රු.565,471ක් වූ අතර හිඟ කාලය මාස 02 සිට මාස 10 දක්වා විය. | හිඟ කඩ කුලී හා විදුලි ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ හිටි කඩකාමර කුලී බදුකරුවන් හට නීතිඥයකු හරහා එන්තරවාසි යවා ඇත. ඉදිරි දිනවලදී උසාවි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යොදමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව මගින් විදුලි පහන් යොදා ඇති විදුලි කණු අංකනය කර නොතිබුණු අතර, සභාව මගින් නඩත්තු කරන විදුලි පහන් සංඛ්‍යාව කොපමණද යන්න නිශ්චිතව හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි. තවද, වීථි පහන් නඩත්තුව සම්බන්ධයෙන් විධිමත් පරිදි ලේඛන පවත්වා නොතිබුණු අතර, මාර්ග ආලෝකනය, පහන් ස්ථාපනය හා නඩත්තුව සම්බන්ධයෙන් සභාවේ ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් නොමැති බව නිරීක්ෂණය විය. | වීථි පහන් කණු අංකනය කළ යුතු අතර වීථි පහන් නඩත්තුව සම්බන්ධයෙන් විධිමත් ලේඛන නඩත්තු කිරීම සිදුකළ යුතු වේ. | වීථි පහන් අංකගත කිරීම සඳහා සියළු කටයුතු සිදුකර තිබූ නමුත් රට තුල පවතින කොරෝනා ආපදා තත්ත්වය හේතුවෙන් වීථි පහන් අංක ගත කිරීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වූ අතර කඩිනමින් එහි අංක ගත කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ද්වීතියික ශ්‍රේණියට අයත් පුස්තකාලාධිපති තනතුරු 03ක්, තාක්ෂණ නිලධාරි තනතුරක් , පෙර පාසල් ගුරු තනතුරක් , වැඩ පරීක්ෂක තනතුරක් හා කළමනාකරණ සහකාර තනතුරක් පුරප්පාඩුව පැවතුණි | අවශ්‍යතාවය අනුව විධිමත්ව කාර්යය මණ්ඩල පුරප්පාඩු පිරවීමේ කටයුතු සිදුකළ යුතු වේ. | ද්වීතියික මට්ටමේ තනතුරු සඳහා පත්කිරීම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පමණක් සිදුකරනු ලබන අතර මේ සම්බන්ධයෙන් කාර්තු වශයෙන් කාර්යය මණ්ඩල වාර්තා තොරතුරු යවනු ලැබේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 සහ 2018 වර්ෂවල රු.21,262,185ක් වැයකර ඉදිකර තිබුණු නීලබැම්ම නිවාඩු නිකේතනය, සති පොළවල් 02ක් සහ ජල පිරිපහදු ඒකකය නිශ්ක්‍රීයව පැවතුණි. | සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ක්‍රමවේද සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. | නීලබැම්ම නිවාඩු නිකේතනය පිහිටි ඉඩම පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. තබ්බෝව හා වීරපුර සතිපොළවල් හා ජල පිරිපහදු ඒකකය 2020 ජනවාරි මාසයේ |

| | | |
|---|---|---|
| | | ටෙන්ඩර් සිදු කරන ලදී. නමුත් කිසිදු ඉල්ලුම්කරුවෙකු ඉදිරිපත් නොවුණි. ජල පිරිපහදු ඒකකය සඳහා නැවත මැයි මාසයේ ලංසු කැඳවා ඇත. ලංසු විවෘත කිරීම ජුනි මාසයේ සිදු කරනු ලබයි. |

## 3.5 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ගොඩනැගිලි පිහිටි ඉඩම් හා සභාව විසින් භුක්ති විඳින, පාලනය හා නඩත්තු කෙරෙන ක්‍රීඩාපිටි, ප්‍රජාශාලා පිහිටි භූමි හා සුසාන භූමි 70ක නිත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | සභාව විසින් භුක්ති විඳින නමුත් පවරා නොගත් වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරමි. |

## 3.6 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රඹාවැව ජල ව්‍යාපෘතියේ කාණු කැපීම සඳහා බැකෝ යන්ත්‍රයක් කුලියට ගැනීම<br>2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3(ඊ) වගන්තියට පටහැනිව උක්ත කාර්යය සඳහා සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද මුද්‍රා නොතබන ලද විවෘත ලංසු ලේඛන භාරගෙන ප්‍රසම්පාදන කමිටුව විසින් ඇගයීම් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු වේ. | මෙම කාර්යය සඳහා ප්‍රදේශයේ කුඩා පරිමාණයේ සැපයුම්කරුවන් විසින් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර, එම සැපයුම්කරුවන් විසින් ප්‍රසම්පාදන උපදෙස් පත්‍රිකාවේ සඳහන් උපදෙස් පිළිපැදීමකින් තොරව මුද්‍රා නොතබන ලද ලංසු ඉදිරිපත් කර තිබුණි. වැඩි තරඟකාරීත්වයක් අපේක්ෂා කිරීම හේතුවෙන් ලැබුණු සියළු ලංසු භාරගත් අතර, ඉදිරියේදී අදාල නීති රීති අනුව කටයුතු කරමි. |
| (ආ) රඹාවැව ජල ව්‍යාපෘතිය සඳහා ජල නල උපාංග මිලට ගැනීම<br>2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදයට පටහැනිව ඉහත කාර්යය සඳහා ලංසු ඉදිරිපත් කිරීමට දින | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන | අදාළ කාර්යය සඳහා ලංසු කැඳවීමේදී දින 07ක කාලයක් ලබා දුන් අතර, වැට් බද්දේ සිදු වූ අඩුවීමත් සමග නැවත මිල කැඳවීම් කරන ලදී. එහිදී මිල ඉදිරිපත් කිරීමේ කාලය දින 05ක් පමණක් |

| | | |
|---|---|---|
| 05ක කාලයක් ඉඩදී තිබුණි. තවද රු.8,715,530ක් වූ ඉහත ද්‍රව්‍ය සැපයීම සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) වගන්තියේ දැක්වෙන පරිදි විධිමත් ගිවිසුමක් ලියා අත්සන් කර නොතිබුණි. | කටයුතු සිදු කළ යුතු වේ. | ලබා දෙමින් පළමුව මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවන් තිදෙනාගෙන් මිල ගණන් කැඳවන ලදී. වැට් බදු සංශෝධනය අනුව කටයුතු කිරීම නිසා සභාවට රුපියල් පන්ලක්ෂ පනස් දාහකට වැඩි ලාභයක් ලැබුණු අතර, තරඟකාරිත්වයේ අඩු වීමක් සිදු නොවුණි. ඉදිරියේදී ද්‍රව්‍ය මිලදී ගැනීම්වලදී ගිවිසුම්ගතවීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**4.1 අභ්‍යන්තර විගණනය**

----------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන සැලැස්මක් පිළියෙල කර තිබුණද සභාව සතු පුස්තකාල, පෙර පාසල්, මහජන සේවා සැපයීම හා වීථි පහන් නඩත්තුව වැනි ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | වැදගත් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විගණනය සැලසුම් කර විගණන කටයුතු සිදු කළ යුතු වේ. | මෙම වර්ෂය සඳහා විගණන සැලැස්මක් පිළියෙල කර ඇති අතර එහි සභාව සතු පුස්තකාල, පෙරපාසල්, මහජන සේවා සැපයීම, වීථි පහන් නඩත්තුව යනාදිය ඇතුලත් කොට නොතිබූ අතර ඉදිරියේදී සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |